# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 08/2016** (ii)

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 සැප්තැම්බර් මස 4 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය - ( වෛද්‍ය/ දන්ත වෛද්‍ය) සහ (වෛද්‍ය / දන්ත වෛද්‍ය)-නොවන තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි සඳහා සංශෝධන**

ඉහත කරුණ සම්බන්ධයෙන් වන 2016.11.17 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක **08/2016** (i) මඟින් සංශෝධිත 2016.06.14 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2016 හි 04 ඡේදයේ අවසන් වගන්තිය සංශෝධනය කිරීමට කොමිෂන් සභාව 2017.07.20 දින පැවති සිය 968වන සභා වාරයේ දී තීරණය කරන ලද අතර ඒ අනුව, කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2016 හි සංශෝධිත 04 ඡේදය පහත දක්වා ඇත;

> " 04. සියලුම පීඨවල, අවම වශයෙන් එක් අවුරුදු කාල සීමාවකින් යුත් අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන පශ්චාත් උපාධියක් ලබා තිබීම කථිකාචාර්යවරයෙකුගේ (ආධුනික) සේවා ස්ථිරත්වය සඳහා සහ U- AC 3 (III) වැටුප් පරිමාණයේ පිහිටුවීම සඳහා පමණක් ප්‍රමාණවත් සුදුසුකමක් වනු ඇත. කෙසේ වුවද, එවැනි පශ්චාත් උපාධියක් සඳහා ලියාපදිංචි වීමට ප්‍රථමව, අධ්‍යයනාංශ ප්‍රධානී, අදාළ පීඨයේ පීඨාධිපති, සහ උප කුලපතිවරයාගේ නිර්දේශය මත උපාධියේ අදාළතාව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කළ යුතුය. පාලක සභාවේ අනුමැතිය පාඨමාලාවේ විස්තර සමඟ අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතු වන්නේය."

03. මෙම තීරණය 2017 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

04. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්

13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන් /ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/2/3/106

ටී /-